සිංහල භාෂාව හා සාහිත්‍යය

5 පාඩම - ආචාර්ය සී ඩබ්ලිව් ඩබ්ලිව් කන්නන්ගර.

➢ **ඉගෙනුම් ඵල -**

- සිංහල භාෂාවේ එන උපසර්ග පද 20 හඳුනාගනී.
- එම උපසර්ග ඇතුළත් පද පෙළ පොතෙන් සොයා ලියයි.
- දෙන ලද අභ්‍යාසවලට සාර්ථකව පිළිතුරු ලියයි.

1. 9 ශ්‍රේණියේ ඉගෙනගත් උපසර්ග පද ලියන්න.

.....

.....

.....

.....

.....

2. සිංහල භාෂාවේ ඇති උපසර්ග පද ගණන කීය ද? .....
3. පහත එක් එක් පේළියේ උපසර්ගයක් රහිත පදයක් ඇත. එය තෝරන්න.

I. උපනායක, අපහරණ, සරත්, සවල
II. පිළිවදන, අභියෝග, අදහස, පරිගණක
III. වියන, සුචරිත, සරාගී, අධිපති
IV. ප්‍රතිඵල, අවමංගල, අඩුවීම, සුලබ
V. අනුශූරතා, අවිය, නිර්දෝෂ, දුදන

සිංහල සාහිත්‍ය සංග්‍රහය

3 පාඩම - භානා හීය පානා අඬහැරෙන් දැනේ

➢ **ඉගෙනුම් ඵල -**

- නියමිත ජන කවි පරිශීලනය කරමින් ජන ජීවිතයට අවශ්‍ය අත්දැකීම් ලබා ගනී. ඒවා ලියා දක්වයි.

1. සරල කෘෂිකාර්මික ජීවන රටාවේ දී ඊට අවශ්‍ය
   I. වෘත්තීය ජීවිතයේ සාර්ථකත්වය සඳහා ද,
   II. පවුල් ජීවිතයේ සාර්ථකත්වය සඳහා ද

   ඉවහල් වන උපදේශ ජන කවියෙහි ඇතුළත් වෙයි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.